# මහ බැංකු ගිණුම් හා ගණුදෙනු

1965 වසරේ මහ බැංකුවේ මුදල් පිළිබඳ ගිණුම් දෙවැනි පරිශිෂ්ටයේ 6 වැනි සංඛ්‍යා සටහනෙහි දක්වේ. 1964 වසර හා සැසඳීමේදී දක්නට ලැබුණු ප්‍රධාන වෙනස්කම් පහත දක්වේ:—

| | වෙනස | |
|---|---|---|
| | රුපියල් දශලක්ෂ | සියයට ගණන |
| මුළු ඉල්ලුම් වගකීම | + 119·0 | + 9·1 |
| සංසරණයෙහි ඇති මුදල් | + 70·6 | + 7·6 |
| ඉල්ලුම් තැන්පතු | + 48·4 | + 13·0 |
| මෙයින් වෙළෙඳ බැංකුවල | — 7·8 | — 5·3 |
| ජාත්‍යන්තර සංචිතය | + 146·3 | + 107·7 |
| දේශීය වත්කම් | – 23·5 | – 1·7 |
| රජයේ හා රජය ඇපවූ සුරැකුම්පත් | – 38·7 | – 3·4 |

\+ වැඩිවීම.
— අඩුවීම.

රන් පවුම්, එ. ජ. ඩොලර් සහ ඉන්දියානු රුපියල සඳහා මහ බැංකු අනුපාතිකයන් හි වෙනසෙක් අවුරුද්ද තුළදී ඇති නොවිණි. එකී අනුපාතිකයන් පහත දක්වේ:—

| | | | |
|---|---|---|---|
| රන් පවුම් (ලංකා රුපියලකට) | එතැන් ඉදිරි (සමස තෙක්) | විදුලි පුවත් මගින් මිලට ගැනීම සි: 1 පැ: 6 3/64 එතැන් සඳහා මසක වට්ටම පැ: 1/128 | විදුලි පුවත් මගින් විකිණීම සි: 1 පැ: 6 1/32 එතැන් සඳහා මසක අධිමිල පැ: 1/128 |
| එ. ජ. ඩොලර් (සියයට) | එතැන් ඉදිරි (තෙමස තෙක්) | රු: 477.00 රු: 477.00 | රු: 477.25 එතැන් සඳහා මසක අධිමිල සත 25 යි. |
| ඉන්දියානු රුපියල් (සියයට) | එතැන් ඉදිරි (සමස තෙක්) | රු: 99 3/4 එතැන් සඳහා මසක වට්ටම රු: 1/32 | රු: 99 13/16 එතැන් සඳහා මසක අධිමිල රු: 1/32 |

මහ බැංකුවේ විදේශීය විනිමය ගනුදෙනු දෙවැනි පරිශිෂ්ටයේ 6 වැනි සංඛ්‍යා සටහනේ දක්වා ඇත.

ඇතැම් නියමිත ගනුදෙනු නිසා උද්ගතවන රජයේ සුරැකුම්පත් හා භාවිතීය පොරොන්දු නෝට්ටු ඇපයට තබා දෙන අත්තිකාරම් සඳහා වන මහ බැංකු පොළී අනුපාතිකය අවුරුද්ද තුළදී වර්ෂයකට සියයට 5 තෙක් වැඩි කරන ලදී. එසේ වුවද, මෙරට වගා කරන කෘෂිකාර්මික නිෂ්පාදිත මිලට ගැනීම, විකිණීම හා ගබඩා කිරීම නිසා උද්ගත වන සමුපකාර සමාගම්වල භාවිතීය පොරොන්දු නෝට්ටු ඇපයට තබා දෙන අත්තිකාරම් සඳහා වන මහ බැංකු පොළී අනුපාතිකය වර්ෂයකට සියයට 3 හි නොවෙනස්ව පැවතිණි. භාණ්ඩාගාර බිල්පත් සඳහා මහ බැංකුවෙන් කැරෙන වට්ටම් අනුපාතිකය, පිළිගත් අඩුම ටෙන්ඩර් අනුපාතික

සාමාන්‍යයෙන් සියයට 1/8 ට තවදුරටත් නියම කැරිණි. කර්මාන්ත, කෘෂිකර්මාන්ත වෙළෙඳාම හෝ වෙළෙඳ ව්‍යාපාර ඇති කිරීම හෝ සංවර්ධනය හෝ සඳහා මහ බැංකුව විසින් ණය දෙන ආයතනවලට දෙන මුදල්, නැවත ගෙවීම සඳහා වූ ණය වෙනුවෙන් පොළී අනුපාතිකය වර්ෂයකට සියයට 5 ගණනේ නො වෙනස්ව පැවතිණි.

**මුදල් නිකුතුව.**

වර්ෂය තුළදී රුපියල් කෝටි 7·06 කින් වැඩිවූ මුදල් සංසරණය 1965 අවසානයේදී රුපියල් කෝටි 100·27 ක් විය. 1965 වර්ෂය තුළ රු: 100/= නෝට්ටු සංසරණය රුපියල් කෝටි 7·15 කින් හා රු: 50/- නෝට්ටු සංසරණය රුපියල් කෝටි 3·94 කින් වැඩිවූ අතර, රුපියල් 10/- යේ නෝට්ටුවල සංසරණය රුපියල් කෝටි 3·98 කින් අඩුවිය.

**ආදායම් හා වියදම්.**

මේ වර්ෂයේ මහ බැංකුවේ ආදායම රු: 2,01,00,044 ක් විය. වසරේ මහ බැංකු වියදම, මුදල් නීති පනතේ 38 වැනි වගන්තියේ විධිවිධාන වලට අනුව, සංචිත සඳහා වෙන් කැරුන රු: 38,00,000 ඇතුළුව, රු: 1,89,50,801 ක් විය. රු: 11,49,243 ක් වූ ශුද්ධ ලාභය, මුදල් නීති පනතේ 39 (අ) ඡෙදය ප්‍රකාර, පනතේ 40 වැනිඡෙදය යටතේ, වර්ෂය තුළදී ඇති කරන ලද මුදල් ගැලපුම් ගිණුම් අඩු කිරීම සඳහා යොදන ලදී.

**බැංකු පරිපාලනය.**

1965 වර්ෂයේදී, මුදල් නීති පනතේ 29 (1) වගන්තිය යටතේ බැංකු පරිපාලන දෙපාර්තමේන්තුව විසින් වෙළෙඳ බැංකු 5 ක් පරීක්ෂා කර බලන ලදී. විශේෂ විධිවිධාන යටතේ සමුපකාර බැංකුවක් ද පරීක්ෂා කරන ලදී.

1957 අංක 42 දරන බැංකු හර බද්ද ක්‍රියාත්මක කිරීමේ කාර්‍යයන් සහ 1961 අංක 65 දරන මුදල් නීති පනතේ, බැංකු ගිණුම් ඇරඹීම හා සම්බන්ධිත iii වැනි කොටස ක්‍රියාත්මක කිරීමේ කටයුතු තවදුරටත් දෙපාර්තමේන්තුව විසින් කරනු ලැබිය.